# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2370/10 - 2024 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාදා - 2024.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DIVPP/LAND/LA/ACQUI/10/8/1.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/18/2020/WS/239.

පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම් විස්තර*:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 354 - පොල්පිතිගම ග්‍රාම නිලධාරි වසමේ , ගලපිටගම ගමෙහි ක.සි.421484 හි කලාප අංක 01, පත්‍ර අංක 02 හි 2023.12.01 දින පහත සඳහන් කර ඇති ඉඩම් කැබලි.

01. කැබලි අංක 1
ඉඩමේ නම: දන්ගහමුල වත්ත, නුගගහමුලගල, නුගගහමුලහේන; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක කොටස් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: නුවර මහ දේවාලය; ප්‍රමාණය: හෙක්: 0.0081.

02. කැබලි අංක 2
ඉඩමේ නම: බඹරගලපාවුලහේන්යාය, ගලපිටගමහේන, ගලපිටගමවැව හා පන්සල්වත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිලි දෙකක කොටස් හා ජල කුළුනක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: නාගොල්ල පුරාණ රජමහා විහාරය; ප්‍රමාණය: හෙක්: 0.0924.

ඉහත සඳහන් ඉඩම් කැබැලි සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 මාර්තු මස 21 වැනි දින පෙ.ව. 10.00 ට පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2024 මාර්තු මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. එම්. එස්. දසනායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්පිතිගම.

2024 ජනවාරි මස 31 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0038

1A - G 041373 – 10 (2023/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*